**මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය**

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන (PL1-2016) සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරුවලට බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

1.0 මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන (PL1-2016) සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරුවලට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලත් මධ්‍යම පළාතේ පදිංචි අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| 1.1 බඳවා ගන්නා තනතුර | : | සෞඛ්‍ය කාර්යය සහායක (කණිෂ්ඨ) |
| 1.2 බඳවා ගන්නා ශ්‍රේණිය | : | 111 ශ්‍රේණිය |
| 1.3 තනතුරෙහි රාජකාරී ස්වභාවය | : | මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය කාර්ය සහායක තනතුරට පැවරෙන සියළුම රාජකාරී |

2.0 තනතුරට අදාල වැටුප :

අංක 3/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරේ III, II, I හා විශේෂ ශ්‍රේණිය සඳහා අදාළ මාසික වැටුප් පරිමාණය 24,250 – 10 × 250 - 10 × 270 - 10 × 300 - 12 ×330 - 3 6,410 ක් වේ. ඉහත චක්‍රලේඛනයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට හෝ වැටුප් ගෙවනු ලැබේ.

3.0 තෝරා ගනු ලබන අයදුම්කරුවන් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය.

4.0 සුදුසුකම්

4.1 අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.

4.2 වෘත්තීය සුදුසුකම් :
අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙරාතුව අවම වශයෙන් වසර 3ක් මධ්‍යම පළාතේ ස්ථිර ලෙස පදිංචිවී සිටින බව තහවුරු කළ යුතුය.

4.4 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් ද යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.6 වයස ;
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවම වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.

5.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම

a. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. අංක 01 සිට 08.1 දක්වා අයිතමයන් 01 පිටුවේ ද, අංක 08.2 සිට 11 දක්වා සියලුම අයිතමයන් 02 පිටුවේ ද, ඇතුළත් වන පරිදි සෑම ආකාරයකින්ම සමාන වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

b. නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

c. 2018.07.16 වැනි දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6.0 අයදුම්පත්‍ර යොමු කිරීම

සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර 2018.07.16 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය,
තැ.පෙ. 121.
සංඝරාජ මාවත,
මහනුවර

7.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණය සඳහා සෑම අයදුම්කරුවෙකුම තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

ලේකම්

2018 ජුනි මස 25 වැනි දින,
මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය,
සංඝරාජ මාවත,
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**<u>මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන (PL1-2016)</u>**
**<u>සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරුවලට බඳවාගැනීම</u>**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. මුලකුරු සමග නම : .............................................................................(මහතා/ මහත්මිය/ මෙනවිය)

2. මුලකරු වලින් හැඳින්වෙන නම් : ..................................................................................................................
   (පැහැදිලි අකුරෙන් ) ..................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................

4. උපන් දිනය :
   වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
   4.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසය :
   අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

5. ස්ත්‍රී/ පුරුෂ භාවය : ............................................

6. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) : ..................................................................................................................
   ..................................................................................................................
   ..................................................................................................................
   ..................................................................................................................
   .
   6.1 පදිංචි දිස්ත්‍රික්කය : .................................. ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ....................................
   6.2 ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය : ...................................................................................
   6.3 මධ්‍යම පළාතෙහි පදිංචිව සිටින්නේ කවදා සිට ද? .......................................................

7. දුරකථන අංකය : ස්ථාවර: .................................................... ජංගම ....................................................

8. අධ්‍යාපන සුදුසුකම් :
   අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :
   8.1 පළමුවර
   i. විභාගයට පෙනී සිටි වර්ෂය හා මාසය : ............................................................
   ii. විභාග අංකය : ........................................................................
   iii. සමත් වූ විෂයන් :

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |

| | | | |
|---|---|---|---|
| 3 | | 7 | |
| 4 | | 8 | |

8.2 දෙවන වර

i. විභාගයට පෙනී සිටි වර්ෂය හා මාසය : ...............................................................

ii. විභාග අංකය : ...............................................................

iii. සමත් වූ විෂයන් :

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

9. වෘත්තීය සුදුසුකම් : ....................................................................................................................................

....................................................................................................................................

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

ඔව් ☐ නැත ☐

11. අයදුම්කරුගේ සහතිකය

a) මෙම අයදුම්පත්රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්ය හා නිවැරදි බව ද,

b) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්රකාශය අසත්ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද, ප්රකාශ කරමි.

.......................................................

අයදුම්කරුගේ අත්සන

දිනය : ..........................................